2010, සේවානියුක්ති (සංශෝධන) ආඥාපනත,

# සඳහා
# සංක්ෂිප්ත මාර්ගෝපදේශයක්

# A Concise Guide to the
## Employment (Amendment) Ordinance 2010

*(Sinhala)*

Labour Department

# පටුන


පෙරවදන 2

සංශෝධන ආඥාපනත යටතේ සිදු කළ සංශෝධනවල සාරාංශය 3

ප්‍රධාන විධිවිධානවල වැදගත් කරුණු 4

1 වන උප ග්‍රන්ථය, නිදසුන් 7

2 වන උප ග්‍රන්ථය, විමසීම් 10

# පෙරවදන

සේවානියුක්ති ආඥාපනතට ("සේ.නි.ආ.") 2010 සේවානියුක්ති (සංශෝධන) ආඥාපනත මගින් කරන ලද ප්‍රධාන වෙනස්කම් සරල බසින් මෙම පොත් පිංච ඉදිරිපත් කරයි. සේ.නි.ආ. පිළිබඳ වැඩි විස්තර සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලැබ ඇති " 2010, සේවා නියුක්ති (සංශෝධන) ආඥාපනත සඳහා සංක්ෂිප්ත මාර්ගෝපදේශය " කියවන්න.

මෙම පොත් පිංච සහ " සේවානියුක්ති ආඥාපනත සඳහා සංක්ෂිප්ත මාර්ගෝපදේශය" http://www.labour.gov.hk/eng/public/content2_3.htm වෙතින් බා ගත හැකි ය.

සටහන: මෙම පොත් පිංචෙහි සපයා ඇති තොරතුරු දැනගැනීම සඳහා පමණි. පැහැදිලි කරනු ලැබ ඇති නීති විධිවිධාන සඳහා සංශෝධන ආඥාපනත සහ සේ.නි. ආඥාපනත එකම අධිකාරී බලය ලෙස පවතී. වැඩි විස්තර ලබා ගැනීම සඳහා ඔබට, කම්කරු දෙපාර්තමේන්තුවේ පහත සඳහන් වෙබ් අඩවි වෙත යාමට හැකි ය.

2010 සේවානියුක්ති (සංශෝධන) ආඥාපනත :-

http://www.labour.gov.hk/eng/news/EAO2010.htm

සේවානියුක්ති ආඥාපනත:-

http://www.labour.gov.hk/eng/legislat/contentB2.htm

# සංශෝධන ආඥාපනත යටතේ සිදු කළ සංශෝධනවල සාරාංශය

සංශෝධන ආඥා පනතේ ප්‍රධාන අරමුණ වනුයේ සේවානියුක්තයන්ගේ අයිතිවාසිකම් තවදුරටත් තහවුරු කරනු පිණිස, සේවානියුක්ති ආඥාපනත යටතේ කම්කරු විනිශ්චය සභාව (“ක.වි.ස.”) විසින් හෝ සුළු සේවානියුක්ති හිමිකම් විනිශ්චය මණ්ඩලය (“සු.සේ.නි.හි.වි.ම.”) විසින් හෝ තීරණයක් මගින් ප්‍රදානය කරනු ලැබූ වේතන සහ ව්‍යවස්ථාපිත හිමිකම්වලින් (SIC) (නිශ්චිත හිමිකම්වලින්) සමන්විත යම් මුදලක් ගෙවීම සේවායෝජකයකු පැහැර හැරීම සම්බන්ධයෙන් වරදක් නිර්මාණය කිරීමයි. (“ නිශ්චිත හිමිකම් ” යන්නෙහි ඇතුළත් වන කරුණු අර්ථ නිරූපණය කර ඇති ආකාරය පිළිබඳ ව පසු ව සඳහන් කර ඇති කොටස බලන්න.)

ක.වි. සභාව විසින් හෝ සු.සේ.නි.හි.වි.මණ්ඩලය විසින් හෝ තීරණයක් මගින් ප්‍රදානය කරනු ලැබූ ආකාරයට එම මුදල සේවායෝජකයකු නොපමා ව ගෙවිය යුතු ය. ගෙවිය යුතු බවට නියම කරන ලද මුදල එය ගෙවීමට නියමිත දිනය ඉකුත් වීමෙන් පසුව දින 14 ක් ඇතුළත (1 වන උපග්‍රන්ථයේ 1 වන සහ 2 වන නිදසුන් බලන්න) ගෙවීම හිතාමතා ම සහ නිදහසට සාධාරණ හේතුවක් නොමැති ව පැහැර හරින සේවා - යෝජකයකයෙක් සංශෝධන ආඥාපනත යටතේ නඩු පවරනු ලැබීමට සහ වරදකරු බවට තීරණය කරනු ලැබීමෙන් පසුව, ඩොලර් 350,000 ක දඩයකට සහ අවුරුදු තුනක බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට යටත් වන්නේ ය.

## ආරම්භවන දිනය

සංශෝධන ආඥා පනත 2010 ඔක්තෝබර් මස 29 වන දින සිට බලාත්මක වන අතර, බලාත්මක වන දිනයේ දී හෝ ඉන් පසුව ( 1 වන උප ග්‍රන්ථයේ 3 වන නිදසුන බලන්න) ක.වි. සභාව විසින් හෝ සු.සේ.නි.වි.මණ්ඩලය විසින් හෝ කරනු ලැබූ (“ විනිශ්චය සභාවක තීරණයක් මගින් කරනු ලැබූ ප්‍රදානය ” යනුවෙන් මෙහි මින් මතුවට හඳුන්වනු ලබන) (1 වන සටහන) ප්‍රදානයකට අදාළ වේ.

(1 වන සටහන) “ විනිශ්චය සභාවක තීරණයක් මගින් කරනු ලැබූ ප්‍රදානය ” යන්නෙහි, කම්කරු විනිශ්චය සභා ආඥාපනත යටතේ කම්කරු විනිශ්චය සභාව විසින් හෝ සුළු සේවානියුක්ති හිමිකම් විනිශ්චය මණ්ඩලය ආඥාපනත යටතේ සුළු සේවානියුක්ති හිමිකම් විනිශ්චය මණ්ඩලය විසින් හෝ කරන ලද තීරණයක් මගින් කරනු ලැබූ ප්‍රදානයක් ලෙස සලකනු ලබන ප්‍රදානයක්, ආඥාවක් හෝ සමථකරණයක් ඇතුළත් වේ.

# ප්‍රධාන විධිවිධානවල වැදගත් කරුණු

සංශෝධන ආඥාපනත මගින් අර්ථ දක්වන ලද යම් නිශ්චිත හිමිකමක් විනිශ්චය සභාවක තීරණයක් මගින් කරනු ලැබූ ප්‍රදානයක අන්තර්ගත ව ඇති විට, සේවායෝජකයකු අදාළ තීරණය අනුව ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් සංශෝධන ආඥාපනත අදාළ කරගත හැකි වන්නේ ය.

## I. " නිශ්චිත හිමිකම" යන්නෙහි ඇතුළත් වන කරුණු අර්ථ නිරූපණය කර ඇති ආකාරය

" නිශ්චිත හිමිකම් " යන්නෙහි, වේතන, වර්ෂාවසාන ගෙවීම, මාතෘත්ව නිවාඩු වැටුප්, විභේදනය කිරීමේ ගෙවීම් (රැකියා ගිවිසුම් අවසන් කිරීම වෙනුවෙන් කරන ගෙවීම්), දීර්ඝ කාලීන සේවය සඳහා ගෙවීම, අසනීප දීමනාව, නිවාඩු දින වැටුප, වාර්ෂික නිවාඩු වැටුප, මෙන් ම අසාධාරණ හෝ අනීත්‍යානුකූල ලෙස සේවයෙන් පහකිරීම් වෙනුවෙන් සේ.නි.ආඥාපනතේ " සේවානියුක්ති ආරක්ෂණය " යන කොටස යටතේ ප්‍රදානය කරනු ලබන ආන්තික ගෙවීම් සහ වන්දි ආදී සේ.නි. ආඥාපනතේ අපරාධ දණ්ඩන මගින් තහවුරු කරනු ලැබූ වැටුප් හා ව්‍යවස්ථාපිත හිමිකම් ඇතුළත් වේ.

## II. විනිශ්චය සභාවක තීරණයක් මගින් කරනු ලැබූ ප්‍රදානයක් අනුව ගෙවීම පැහැර හැරීම සාපරාධී වරදකි

සංශෝධන ආඥාපනත මගින් අර්ථ දක්වන ලද (වේතන, වර්ෂාවසාන ගෙවීම, මාතෘත්ව නිවාඩු වැටුප්, විභේදනය කිරීමේ ගෙවීම (රැකියා ගිවිසුම් අවසන් කිරීම වෙනුවෙන් කරන ගෙවීම් ආදි) (2 වන සටහන), යම් නිශ්චිත හිමිකමක් සේවායෝජකයා ගෙවිය යුතු බවට විනිශ්චය සභාවක තීරණයකින් කරනු ලැබූ ප්‍රදානයක නියම කර තිබේ නම් සහ එම මුදල ගෙවීමට නියමිත දිනය ඉකුත් වීමෙන් පසු දින 14 ක් ඇතුළත හිතාමතා ම සහ සාධාරණ හේතුවක් නොමැති ව සේවායෝජකයා එම මුදල ගෙවීම පැහැර හරි නම් (3 වන සටහන) එම සේවායෝජකයා නඩු පැවරීමට යටත් වන අතර, වරදකරු බවට තීරණය කරනු ලැබීමෙන් පසු ඩොලර් 350,000 ක දඩයකට සහ අවුරුදු තුනක බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට යටත් වන්නේ ය.

තීරණයක් මගින් කරනු ලැබූ ප්‍රදානය යටතේ ගෙවිය යුතු මුදලින් යම් කොටසක් ගෙවීම පැහැර හැරීමකට නව වරද අදාළ වන්නේ ය. වාරික ව ගෙවිය හැකි මුදලක් සම්බන්ධයෙන් වන විට යම් වාරිකයක් හෝ වාරිකයකින් කොටසක් හෝ ගෙවීම පැහැර හැරීමකට ද නව වරද අදාළ වන්නේ ය.

[තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදල ගෙවිය යුතු දිනය ඉකුත් වීමෙන් පසු දින 14 ක කාල සීමාව තීරණය කරන ආකාරය සම්බන්ධයෙන්] (නිදසුන් 1 වන උපග්‍රන්ථයෙහි පරිශීලනය සඳහා දක්වා ඇත.)

(2 වන සටහන) යම් ප්‍රතිවිරුද්ධ සාක්ෂියක් තිබුණහොත් මිස, යම් මුදලක් ගෙවන ලෙස විනිශ්චය සභාවක තීරණයකින් කරනු ලැබූ ප්‍රදානයක් මගින් නියම කරන නමුත්, එම මුදලෙහි කිසියම් නිශ්චිත හිමිකමක් අඩංගු වන්නේ ද, අඩංගු නොවන්නේ ද, යන්න නොදැක්වෙන විට සහ තීරණයට සම්බන්ධ හිමිකමේ යම් නිශ්චිත හිමිකමක් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ අන්තර්ගත වන විට, නිශ්චිත හිමිකමක් ගෙවීම සඳහා විධානයක් තීරණය කරනු ලැබූ ප්‍රදානය මගින් කර ඇති ලෙසට සැලකිය යුතු ය.

(3 වන සටහන) තීරණය මගින් කරනු ලැබූ ප්‍රදානයේ සඳහන් මුදල ගෙවිය යුතු දිනයක් තීරණයේ සඳහන් කර නොමැති නම් එම මුදල තීරණයේ සඳහන් කර ඇති දිනය ඉකුත් වීමෙන් පසු දින 14 ක් ඇතුළත ගෙවනු ලැබිය යුතු ය.

## III. සංශෝධන පනත යටතේ සංස්ථාගත මණ්ඩලයක අධ්‍යක්ෂක මණ්ඩලය, හවුල්කරුවන් ආදීන්ගේ සාපරාධී වගකීම

තීරණයක් මගින් ප්‍රදානය කරනු ලැබූ මුදලක් ගෙවීම, එම මුදල ගෙවීමට නියමිත දිනය ඉකුත් වී දින 14 ක් ඇතුළත සංස්ථාගත මණ්ඩලයක් හිතමතා ම සහ නිදහසට සාධාරණ හේතුවක් නොමැති ව පැහැර හරින විට සහ එම වරද යම් අධ්‍යක්ෂවරයකුගේ හෝ වෙනත් යම් වගකිවයුතු තැනැත්තකුගේ එකඟතාව හෝ නිහඬ අනුමතිය ඇති ව කර ඇති බවට හෝ එය එම අධ්‍යක්ෂවරයාගේ හෝ එම තැනැත්තාගේ යම් නොසලකා හැරීමකට ආරෝපණය කරනු ලැබිය හැකි බවට හෝ ඔප්පු කරනු ලැබ ඇති විට, එම තැනැත්තා එම වරදට වරදකරු වන්නේ ය. ඒ සඳහා උපරිම දඬුවම, ඩොලර් 350,000 ක දඩයක් සහ අවුරුදු තුනක බන්ධනාගාර ගත කිරීමකි.

තීරණයක් මගින් ප්‍රදානය කරනු ලැබූ මුදලක් ගෙවීම, එම මුදල ගෙවීමට නියමිත දිනය ඉකුත් වී දින 14 ක් ඇතුළත ව්‍යාපාර ආයතනයක හවුල්කරුවකු හිතාමතා ම සහ නිදහසට සාධාරණ හේතුවක් නොමැති ව පැහැර හරින විට සහ එම වරද ව්‍යාපාර ආයතනයේ කළමනාකාරිත්වයට සම්බන්ධ වෙනත් යම් හවුල්කරුවකුගේ හෝ තැනැත්තකුගේ හෝ එකඟතාව හෝ නිහඬ අනුමතිය ඇති ව කර ඇති බවට හෝ එය එම හවුල්කරුවාගේ හෝ තැනැත්තාගේ නොසලකා හැරීමකට ආරෝපණය කරනු ලැබිය හැකි බවට හෝ ඔප්පු කරනු ලැබ ඇති විට, එම තැනැත්තා එම වරදට වරදකරු වන්නේ ය. ඒ සඳහා උපරිම දඬුවම, ඩොලර් 350,000 දඩයක් සහ අවුරුදු තුනක බන්ධනාගාර ගත කිරීමකි.

# නිදසුන්

(අ) " තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදල ගෙවීමට නියමිත දිනය ඉකුත් වීමෙන් පසුව එළඹෙන දින 14 ක කාල සීමාව " නිශ්චය කරන ආකාරය

## [1 වන නිදසුන] තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුළු මුදල එකවර ගෙවිය යුතු වන විට :

සේවා ගිවිසුම යටතේ ඇති කොන්දේසි අනුව එක මාසයක දැනුම්දීමක් වෙනුවට එක මාසයක වැටුපක් ලෙස ඩොලර් 7,500 ක් ගෙවා තම සේවකයාගේ සේවය අවසන් කිරීමට සේවායෝජකයා එකග වී ඇත. එම මුදල ගෙවීම පසු ව ඔහු ප්‍රතික්ෂේප කරයි.

දැනුම්දීම වෙනුවට ඩොලර් 7,500 ක වේතන හිමිකමක් සේවකයා තමාගේ සේවායෝජකයාට එරෙහි ව කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු සබඳතා අංශයට ඉදිරිපත් කරයි. සමථයකට පත් වීමෙන් පසුව ද ආරාවුල නොවිසඳී පවතී. ඉන්පසු, සේවකයා, සේවායෝජකයාට එරෙහි ව දැනුම් දීම වෙනුවට වේතන හිමිකමක් සුළු සේවානියුක්ති හිමිකම් විනිශ්චය මණ්ඩලය ("සු.සේ.නි.හි.වි.ම") වෙත ඉදිරිපත් කරයි. සු.සේ.නි.හි.වි. මණ්ඩලය සේවකයාගේ වාසියට 2010 නොවැම්බර් 8 වන දින තීරණය කරන අතර, එදින ම තීරණය මගින් ප්‍රදානයක් කරයි. දැනුම්දීම වෙනුවෙන් ඩොලර් 7,500 ක වේතන 2010 නොවැම්බර් 15 වන දින හෝ ඊට පෙර සේවකයාට ගෙවන ලෙස සේවායෝජකයාට නියම කරනු ලැබ ඇත.

**2010 නොවැම්බර්**

| ඉරි | සඳු | අඟ | බදා | බ්‍රහ | සිකු | සෙන |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 |
| 14 | (15) | 16 | 17 | 18 | 19 | 20 |
| 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 |
| 28 | 29 | 30 | දෙසැ 1 | 2 | 3 | 4 |

තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදල ගෙවීමට නියමිත දිනය (← 15)

නොගෙවීම හෝ ප්‍රමාද වී ගෙවීම (30 →)

[කොටුව] මගින් දැක්වෙන්නේ තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදල ගෙවිය යුතු දිනය ඉකුත් වීමෙන් පසු දින 14 ක කාල සීමාවයි. (එනම් 2010 නොවැම්බර් 16 වන දින සිට 29 වන දින තෙක්). හිතාමතා ම සහ නිදහසට සාධාරණ හේතුවක් නොමැති ව මෙම කාල සීමාව ඉකුත්වීමට ප්‍රථමයෙන් ගෙවීම පැහැර හරින සේවායෝජකයා වරදක් සිදු කරයි.

තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදල වන ඩොලර් 7,500 එය ගෙවීමට නියමිත දිනය (එනම් නියමිත දිනය වන 2010 නොවැම්බර් 15 වන දිනය) ඉකුත් වී දින 14 ක් ඇතුළත (එනම් 2010 නොවැම්බර් 16 වන දින සිට 29 වන දිනය තෙක්) හිතාමතා ම සහ නිදහසට සාධාරණ හේතුවක් නොමැති ව ගෙවීම පැහැර හරින සේවායෝජකයා වරදක් සිදු කරන අතර, නඩු පවරනු ලැබීමට යටත් වේ. වරදකරු බවට තීරණය කරනු ලැබීමෙන් පසු ව ඒ සඳහා උපරිම දඬුවම ඩොලර් 350,000 ක දඩයක් සහ අවුරුදු තුනක බන්ධනාගාරගත කිරීමකි.

## [2 වන නිදසුන] තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදල වාරික වශයෙන් ගෙවිය යුතු වන විට :

සේවකයකු ඩොලර් 12,000 ක කොමිස් මුදලක් සඳහා තම සේවායෝජකයාට එරෙහි ව කම්කරු විනිශ්චය සභාව ("ක.වි.ස") වෙත හිමිකමක් ඉදිරිපත් කරයි. 2010 නොවැම්බර් 3 වන දින පැවති නඩු විභාගයේ දී පාර්ශ්වකරුවන් එකගතා ගිවිසුමකට එළඹෙන අතර, ආරාවුල සම්පූර්ණ වශයෙන් සහ අවසාන වශයෙන් සමථයකට පත් කර ගනිමින් සේවකයා ඉල්ලා සිටි මුදල වාරික 3 කින් ගෙවීමට සේවායෝජකයා එකඟ වෙයි. කම්කරු විනිශ්චය සභාව එකගතා ගිවිසුම අනුමත කර එදින ම ප්‍රදානය නියම කරයි. තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදල පහත සඳහන් දිනවල හෝ ඊට පෙර ගෙවිය යුතු ය.

| වාරික ගණන | දිනය | ගෙවීම |
|---|---|---|
| පළමු වන වාරිකය | 2010 නොවැම්බර් 17 | ඩොලර් 4,000 |
| දෙ වන වාරිකය | 2010 දෙසැම්බර් 17 | ඩොලර් 4,000 |
| තුන් වන වාරිකය | 2011 ජනවාරි 17 | ඩොලර් 4,000 |

සේවායෝජකයා පළමු වන සහ දෙ වන වාරිකවල එකතුව ඩොලර් 8,000 ක මුදලක් පමණක් නියමිත දිනයේ දී ගෙවන නමුත්, ඩොලර් 4,000 ක් වූ තුන් වන වාරිකය 2011 ජනවාරි 31 වන දින හෝ ඊට පෙර ගෙවීම පැහැර හරින්නේ නම් (එනම් තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදලේ තුන් වන වාරිකය ගෙවීමට නියමිත දිනය ඉකුත් වීමෙන් පසු ව එළඹෙන දින 14 ක කාල සීමාව ඉකුත් වීම) සේවායෝජකයා වරදක් සිදු කරන අතර, නඩු පවරනු ලැබීමට යටත් වන්නේ ය.

**2011 ජනවාරි**

| ඉරි | සඳු | අඟ | බදා | බ්‍රහ | සිකු | සෙන |
|---|---|---|---|---|---|---|
| | | | | | | 1 |
| 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 |
| 16 | (17) | 18 | 19 | 20 | 21 | 22 |
| 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 |
| 30 | 31 | පෙබ 1 | 2 | 3 | 4 | 5 |

තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදලේ තුන්වන වාරිකය ගෙවීමට නියමිත දිනය

නොගෙවීම හෝ ප්‍රමාදව ගෙවීම

මගින් දැක්වෙන්නේ තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදලේ තුන් වන වාරිකය ගෙවීමට නියමිත දිනය ඉකුත් වීමෙන් පසු ව එළඹෙන දින 14 ක (එනම් 2011 ජනවාරි 18 වන දින සිට 31 වන දිනය තෙක්) කාල සීමාවයි. හිතාමතා ම සහ නිදහසට සාධාරණ හේතුවක් නොමැති ව මෙම කාලසීමාව ඉකුත්වීමට ප්‍රථම ගෙවීම පැහැර හරින සේවායෝජකයා වරදක් සිදු කරයි.

තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදලේ තුන් වන වාරිකය වන ඩොලර් 4,000 එය ගෙවීමට නියමිත දිනය (එනම් ගෙවිය යුතු දිනය වන 2011 ජනවාරි 17 වන දිනය) ඉකුත් වී දින 14 කාලසීමාව (එනම් 2011 ජනවාරි 18 වන දින සිට 31 වන දිනය තෙක්) ඉකුත් වීමට පෙර හිතාමතා ම සහ නිදහසට සාධාරණ හේතුවක් නොමැති ව ගෙවීම පැහැර හරින සේවායෝජකයෙක් වරදක් සිදු කරන අතර, නඩු පවරනු ලැබීමට යටත් වන්නේ ය. වරදකරුවකු බවට තීරණය කරනු ලැබීමෙන් පසු ව ඒ සඳහා උපරිම දඬුවම ඩොලර් 350,000 ක දඩයක් සහ අවුරුදු තුනක බන්ධනාගාරගත කිරීමකි.

(ආ) සංශෝධන ආඥාපනත ආරම්භ වන දිනය අදාළ කරගත යුතු වන ආකාරය

## [3 වන නිදසුන] සංශෝධන ආඥාපනත අදාළ කරගත යුතු වන ආකාරය

සේවකයකු දීර්ඝ කාලීන සේවය සඳහා ගෙවීමක් වශයෙන් ඩොලර් 35,000 ක් ඉල්ලමින් තම සේවායෝජකයාට එරෙහි ව හිමිකමක් කම්කරු විනිශ්චය සභාව (“ක.වි.ස”) වෙත ඉදිරිපත් කර තීරණයක් මගින් ප්‍රදානයක් තමාගේ වාසියට 2010 නොවැම්බර් 3 වන දින ලබා ගනියි. දීර්ඝ කාලීන සේවය සඳහා ඩොලර් 35,000 ක් 2010 නොවැම්බර් 17 වන දින හෝ ඊට පෙර ගෙවන ලෙස සේවායෝජකයාට නියම කරනු ලැබ ඇත.

**2010 වන වර්ෂය**

| ඉරි | සඳු | අඟ | බදා | බ්‍රහ | සිකු | සෙන |
|---|---|---|---|---|---|---|
| ඔක් 24 | 25 | 26 | 27 | 28 | (29) | 30 |
| 31 | නොවැ 1 | 2 | (3) | 4 | 5 | 6 |
| 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 |
| 14 | 15 | 16 | (17) | 18 | 19 | 20 |

කම්කරු විනිශ්චය සභාව තීරණය ප්‍රදානය කළ දිනය (3)

සංශෝධන ආඥා පනත ආරම්භ වන දිනය (29)

තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදල ගෙවිය යුතු වන දිනය (17)

කම්කරු විනිශ්චය සභාවේ තීරණය කරනු ලැබ ඇත්තේ සංශෝධන ආඥාපනත බලාත්මක වූ (එනම් 2010 ඔක්තෝබර් 29) දිනයෙන් පසු ව බැවින්, සංශෝධන ආඥාපනත මෙම කාරණයට අදාළ වන්නේ ය. තීරණය මගින් ප්‍රදානය කරනු ලැබූ මුදල ගෙවිය යුතු දිනය (එනම් 2010 නොවැම්බර් 17 වන දිනය) ඉකුත් වී දින 14 ක් ඇතුළත ඩොලර් 35,000 ගෙවීම හිතාමතා ම සහ නිදහසට සාධාරණ හේතුවක් නොමැති ව පැහැර හරින සේවායෝජකයෙක් වරදක් සිදු කරන අතර, නඩු පවරනු ලැබීමට යටත් වන්නේ ය. වරදකරුවකු බවට තීරණය කරනු ලැබීමෙන් පසු ව ඒ සඳහා උපරිම දඬුවම ඩොලර් 350,000 දඩයක් සහ අවුරුදු තුනක බන්ධනාගාරගත කිරීමකි.

**සටහන :**

විනිශ්චය සභාවක් 2010 ඔක්තෝබර් 29 වන දිනයට පෙර කරනු ලැබූ තීරණයක් මගින් කරන ලද ප්‍රදානයකට සංශෝධන ආඥාපනත අදාළ නොවන නමුත්, සේවා යෝජකයා විසින් සේවානියුක්ති ආඥාපනත යටතේ (වැටුප් හෝ දිර්ඝ කාලීන සේවය සඳහා ගෙවීම් කිරීම පැහැර හැරීම ආදි) වෙනත් වැරදි කරනු ලැබ ඇති බවට සැක කරනු ලැබ ඇත්නම්, ප්‍රමාණවත් සාක්ෂි තිබේ නම්, කම්කරු දෙපාර්තමේන්තුව සේවායෝජකයාට එරෙහි ව අදාළ වැරදි සම්බන්ධයෙන් නඩු පවරනු ඇත.

# විමසීම්

- **කම්කරු දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ මුල් පිටුව :**
  **www.labour.gov.hk**
- **පැය 24 ක්ෂණික ඇමතුම් දුරකථන මාර්ගය :**
  **2717 1771**
  **(ක්ෂණික ඇමතුම් දුරකථන මාර්ගය මෙහෙයවනු ලබන්නේ "1823" ඇමතුම් මධ්‍යස්ථානය මඟිනි)**
- කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු සබඳතා අංශයේ කාර්යාල
  **http://www.labour.gov.hk/eng/tele/lr1.htm**

මෙම පොත් පිංච http://www.labour.gov.hk/eng/public/content2_3.htm හි ඇති කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවෙන් බා ගත හැකි ය.

Labour Department

7/2011